**සිරකරු සුභසාධක අරමුදලේ 2012**

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1. <u>තත්ත්වාගණනය කල මතය.</u>

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන 2012 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.2.1 <u>ගිණුම්කරණ අඩු පාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). බන්ධනාගාර ආයතන 10 කට පරිත්‍යාග වශයෙන් ලබාදුන් රූපවාහිනී යන්ත්‍ර, ඩීවීඩී යන්ත්‍ර, ක්‍රීඩා භාණ්ඩ ඇතුළු වත්කම් වල වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණු අතර අනුරාධපුර බන්ධනාගාරයට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් පරිත්‍යාග වශයෙන් ලැබුණු රු.5,000 ක් වටිනා සැම්සුන් ඩීවීඩී යන්ත්‍රයක් රු.50,000 ක් ලෙස ගිණම්ගත කර තිබුණි.

(ආ) බෝගම්බර බන්ධනාගාරයේ සිරකරුවන්ට ලබාදුන් රු.77,350 ක් වූ ත්‍යාග වියදම් ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ). 2012 වර්ෂයේ ලැබුණු පරිත්‍යාග වත්කම් වෙනුවෙන් නිවැරදි ක්ෂය වටිනාකම රු.107,241 ක් වුවත්, එය රු.137,155 ක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා ක්ෂය වටිනාකම රු.29,914 ක් වැඩියෙන් දක්වා තිබුණි.

2. <u>මූල්‍ය සමාලෝචනය.</u>

2.1. <u>මූල්‍ය ප්‍රතිඵල.</u>

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.721,303 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.699,262 ක විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.22,040 ක පිරිහීම සඳහා අරමුදලේ ආදායම් රු.87,453 කින් අඩුවීම හා රු.65,413 කින් වියදම අඩුවීම විශේෂයෙන් බලපා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය.

4.1. කාර්ය සාධනය.

සමාලෝචිත වර්ෂයෙ අරමුදලේ ආදායම රු.2,370,853 ක වූ අතර සිරකරුවන්ගේ සුභසාධක කාර්යයන් සඳහා රු.1,447,558 ක් වැයකර තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම් විෂයය | වැයකර තිබූ මුදල<br>රු. |
| --- | ---: |
| සිරකරුවන්ගේ අධ්‍යාත්මික හා ආගමික ශුභ සිද්ධිය | 459,248 |
| සිරකරු අධ්‍යාපනය හා සුභසාධනය | 315,545 |
| සිරකරුවන් සඳහා විනෝද ක්‍රීඩා පහසුකම් සහ වෙනත් පහසුකම් සැළැස්වීම. | 585,242 |
| සිරකරුවන්ට තෑගි දීම | 57,203 |
| සිරකරුවන්ගේ පශ්චාත් භාර සේවා කටයුතු සඳහා වූ වියදම් | 30,320 |
| | 1,447,558 |

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.

5.1. අයවැය පාලනය.

(අ) බන්ධනාගාර ආයතන 12 ක් සම්බන්ධයෙන් අයවැයගත ලැබීම් සහ සත්‍ය ලැබීම් අතර සියයට 32 සිට සියයට 99 දක්වා වූ පරාසයක පහත වැටීමක් නිරීක්ෂණය වූයෙන් ඇස්තමේන්තු ආදායම් අයකර ගැනීම දුර්වල තත්වයක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා සිරකරු සුභසාධක අරමුදලේ අයවැය ඇස්තමේන්තු හා තථ්‍ය ආදායම් සහ වියදම් අතර සියයට 19 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයක් වූයෙන් අයවැය සඵල කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5.2. අභ්‍යන්තර විගණනය.

සිරකරු සුභසාධනය වෙනුවෙන් වූ අරමුදලේ කාර්යයනට අදල අභ්‍යන්තර විගණන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්.

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයේ අඩුපාඩු වරින් වර බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා වෙත යොමු කරන ලදී. පහත සදහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) අයවැය පාලනය.

(ආ) අරමුදල් පාලනය.

(ඇ) සිරකරු සුභසාධනය .

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති.